රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 01/2024

මගේ අංකය : Pns/P7/03-III වෙළුම
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2024.04.16

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>වයස අවුරුදු 45න් පසුව පත්වීම් ස්ථිර කරන ලද සේවකයින් වෙත විශ්‍රාම වැටුප් ලබා දීම</u>**
**<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014, 25/2014 (I) සහ 29/2019 සම්බන්ධයෙනි</u>**

ඉහත කරුණට අදාළව අංක අමප/23/0464/605/024 හා 2023.02.28 දිනැතිව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අංක අමප/23/0136/620/003-I හා 2024.03.11 දිනැතිව අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇත.

02. ඒ අනුව පහත නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

I. 2014.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 හා 2014.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 (I) හි විධිවිධාන අනුව ලබා දී ඇති ස්ථිර පත්වීම් සඳහා එම නිලධාරීන් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ විශ්‍රාම වැටුපක් සඳහා සම්පූර්ණ කළ යුතු අනෙකුත් අවශ්‍යතා සපුරන්නේ නම් තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවා ගන්නා විට වයස අවුරුදු 45 ඉක්මවා තිබුණ ද ඔවුන් සඳහා විශ්‍රාම වැටුප් හිමිකම ප්‍රදානය කිරීම.

II. ඉහත නිර්දේශය 2014.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 හා 2014.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014(I) යන චක්‍රලේඛ සඳහා පමණක් අදාළ කර ගැනීම.

III. 2019.09.18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 29/2019 අනුව අවුරුදු 45 ඉක්මවා තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවාගෙන ඇති සේවකයින් සඳහා ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමේ දී එම චක්‍රලේඛයේ 2 ඡේදයේ (ii) උප වගන්තිය අදාළ කර ගැනීම.

03. ඉහත කරුණු ද සැළකිල්ලට ගෙන අදාළ සේවකයන්ගේ විශ්‍රාම ගැන්වීමේ කටයුතු යථාවත් කිරීමට කටයුතු කළ යුතු වේ.

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011-2682460
ෆැක්ස් : 011-2698460
විද්‍යුත් ලිපිනය : sas-pen@pubad.gov.lk